# ජනප්‍රවාද හා අල්ප පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර සාධක ඔස්සේ ගොඩනැගී ඇති කසාගල පුරාණ රජමහා විහාර ඉතිහාසය

ටී.එම්.අයි.එන්. තෙන්නකෝන්[13]

ජාතික උරුමයන් බඳුවූ පෙර රජදරුවන් විසින් ඉදි කරන ලද ඉපැරණි පූජනීය ස්ථාන පිළිබඳ තොරතුරු රාශියක් විවිධ මූලාශ්‍ර තුළින් හෙළිවේ. විශේෂයෙන්ම දේවානම්පියතිස්ස රජු බුදුදහම වැළඳ ගනිමින් එය මහජනයා අතරට ගෙන යාමට හැකි සියල්ලම සිදු කළේය. ඒ අනුව මෙම සමයේදී භික්ෂූන් වහන්සේලාගේ පහසුව සඳහා අවශ්‍ය වෙහෙර විහාර මෙන්ම වාසය හා භාවනායෝගී කටයුතු සඳහා ගල්ලෙන්වල කටාරද සකස් කරමින් ඒවා විවිධ අවස්ථාවලදී පූජා කර තිබේ. වර්තමානය වන විට ජනප්‍රිය වී ඇති මෙවැනි ලෙන් විහාර ලංකාවේ විවිධ ස්ථානවලින් වාර්තා වේ. නමුත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති මෙවැනි ප්‍රසිද්ධ ඉපැරණි සිද්ධස්ථාන අතරින්, එතරම් තොරතුරු හෙළි නොවන අප්‍රසිද්ධ ස්ථානද හඳුනාගත හැකිය. දෙවනපෑතිස් රාජසමය දක්වා දිවයන ඉතිහාසයක් හිමි කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවට අයත් කුඹුක්ගැටේ පොතානගම තුළ පිහිටි කසාගල පුරාණ රජමහා විහාරය ඉහතින් සඳහන් කළ අප්‍රසිද්ධ වෙහෙර විහාර ගණයෙහි ලා දැක්විය හැකිය. මෙහි ඇති දාගැබ්, සිරිපතුල් ගල්, ඇඹරුම් ගල්, මල් ආසන, ඉපැරණි බෝධීන් වහන්සේ හා ඉපැරණි විහාරගෙය, ප්‍රතිමා, සෙල්ලිපි, පොකුණු, ගල්කණු මෙම විහාර ඉතිහාසය ගොඩනැගීමට මනා රුකුලක් ලබා දෙයි. මෙම විහාරය පිහිටි ප්‍රදේශය ආශ්‍රිතව ජීවත් වන ජනයා තුළින් විහාරයේ ඉතිහාසය හා සම්බන්ධ වන ජනප්‍රවාද රැසක් හෙළි කර ගැනීමට හැකි වේ. ඒවා ජනප්‍රවා ද ලෙස පැවතියද යම් විටක ඒවා දන්නා පුද්ගලයන්ගේ අභාවයද සමඟ එම ජනප්‍රවාද අභාවයට පත් වෙයි. එබැවින් එම ජනප්‍රවාද රැස්කරගැනීම ඉතා වැදගත් වේ. එසේ රැස් කරගත්තාවූ ජනප්‍රවාද මෙන්ම හමුවන අනෙකුත් පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ඔස්සේ මෙම විහාර ඉතිහාසය අවබෝධ කරගැනීම, පුරාවිද්‍යාත්මක වටිනාකම් අවබෝධ කර ගැනීම හා යටපත් වී ගොස් ඇති අගයන් ඉස්මතු කර ගැනීම මෙම පර්යේෂණයෙහි අරමුණු වේ.ඒ අනුව ඉහතින් සඳහන් කළ සාධක ඔස්සේ මෙම කසාගල විහාර ඉතිහාසය අවබෝධ කර ගැනීම, කසාගල විහාරස්ථානයෙහි ඇති පුරාවිද්‍යාත්මක වටිනාකම අවබෝධ කර ගැනීම මෙන්ම යටපත් වී ඇති අගයන් ඉස්මතු කර ගැනීමට මෙම පර්යේෂණයෙන් හැකියාව ලැබී තිබේ.

ප්‍රමුඛ පද: ලෙන්, කටාරම්, ජනප්‍රවාද

[13] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය, isurithennakoon92@gmail.com.